මගේ අංකය
எனது இல.
My No. } HRC/RM/ER/01/2026

දිනය
திகதி
Date. } 2026.10.01

ඔබේ අංකය
உமது இல.
Your No . }

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# Human Rights Commission of Sri Lanka

පොලිස්පති
පොලිස් මූලස්ථානය
කොළඹ

**<u>පොලීසිය වැඩිහිටියන් සඳහා වූ ඒකකයක් ස්ථාපිත කිරීම සම්බන්ධවයි.</u>**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධි විධාන ලෙස ක්‍රියාකරනු ලබන බවට සහතික කිරීමේ අදහසින් එම නීතීන් හා අයිතිවාසිකම් වලට ගරු කිරීම, ප්‍රවර්ධනය කිරීම පිණිස විධායක, පරිපාලනමය පිළිවෙත් පිළිබඳ සුපරීක්ෂාවෙන් සිට නීතිමය හා පරිපාලනමය කාර්යය පටිපාටීන් සකස්කිරීමෙහිලා රජයට අවශ්‍ය උපදෙස් ලබාදීම, සහායවීම සහ එම කාර්යය නිසි පරිදි අදාළ ආයතන විසින් ක්‍රියාත්මක කරන්නේ ද යන්න පිළිබඳව හා ඉහත අවශ්‍යවන්නා වූ සියලු දේ කිරීමට ප්‍රතිපාදන 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත ප්‍රකාරව හිමි ව ඇත.

02. තවද එකී බලතල ප්‍රකාරව පොදු ජනතාවගේ මානව හිමිකම් වලට සෘජු ලෙස බලපාන යම් යම් කරුණු පිළිබඳව පළ කරන වාර්තා සම්බන්ධයෙන් ද මානව හිමිකම් කොමිෂන් සභාව සිය අවධානය යොමු කරයි.

03. ශ්‍රී ලංකාව මේ වන විට ජනගහනය වයස්ගත වෙමින් පවතින බව ප්‍රජා විද්‍යාඥයින් විසින් පුරෝකථනය කර ඇත. ඒ අනුව 2014 වසර වන විට 12.7% ක් වූ වයස අවුරුදු 60 ට වැඩි ජනගහනය වසර 2050 වන විට 25.7% ක් දක්වා ඉහළ යනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

04. වැඩිහිටි අයිතිවාසිකම් සම්බන්ධයෙන් 2000 වසරේ ඇති කරන ලද පනත සහ 2011 වසරේ දී එම පනතට සිදු කරන ලද සංශෝධන මඟින් ශ්‍රී ලංකාව තුළ වැඩිහිටියන්ගේ හිමිකම් සම්බන්ධයෙන් නෛතික පිළිගැනීමක් ලබාදී ඇත. නමුත් විවිධ වූ සමාජ, ආර්ථික කරුණු සහ අභ්‍යන්තර සහ බාහිර සංක්‍රමණ හේතුකොට ගෙන ශ්‍රී ලාංකික වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනයවීමේ ප්‍රවනතාවයක් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව නිරීක්ෂණය කරනු ලැබේ. එහිදී ගෘහස්ථව ජීවත්වන වැඩිහිටියන් මෙන්ම ආයතනගත වැඩිහිටියන්ද මෙම ගැටළුවලට මුහුණ දෙමින් ඇත. ඒ අනුව එම කණ්ඩායම්වල හිමිකම් සුරක්ෂිත කිරීමේදී පොලීසිය මඟින් සුවිශේෂී කාර්යයන් මේවන විටත් ඉටුකරමින් සිටින බව කොමිෂන් සභාව හඳුනාගෙන ඇත.

ප්‍රධාන කාර්යාලය
தலைமைக் காரியாலயம் } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04.
14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு-04.
සභාපති
தவிசாளர்
Chairperson } 011-2505451
ෆැක්ස්
தொலைநகல்
Fax } 011 2505541/74
විද්‍යුත් තැපැල
மின்னஞ்சல்
E-mail } sechrcsl@gmail.com

05. එම කටයුතු වඩාත් ශක්තිමත් කිරීම සඳහා පොලිස් දෙපාර්තමේන්තුව තුළ වැඩිහිටියන් වෙනුවෙන් වෙන් වූ ඒකකයක් ස්ථාපිත කරන්නේ නම් එම කටයුතු වඩාත් කඩිනම් සහ වඩාත් ඵලදායී ලෙස ඉටුකිරීම හැකි බව කොමිෂන් සභාවේ විශ්වාසය වේ.

06. ඒ අනුව ශ්‍රී ලංකාවේ වැඩිහිටියන්ගේ කටයුතු සම්බන්ධයෙන් විශේෂ අවධානයක් ලබාදීම සඳහා ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව තුළ විශේෂ ඒකකයක් ස්ථාපිත කිරීම සුදුසු බව නිර්දේශ කරන බවට 2023.05.11 වන දින ඔබ වෙත ලිඛිතව යොමු කර ඇති නමුත් මේ වන තෙක් එම නිර්දේශය ක්‍රියාත්මක වී නොමැති බවට අපට නිරීක්ෂණය වී ඇත. (එකී නිර්දේශයන්ගේ පිටපතක් ඔබගේ දැනගැනීම සඳහා මේ සමග අමුණා ඇත.)

07. එබැවින් පොලීසිය තුළ වැඩිහිටියන් සඳහා වූ ඒකකයක් ස්ථාපිත කිරීම සම්බන්ධව අප විසින් ඔබ වෙත ඉදිරිපත් කරන ලද නිර්දේශය ක්‍රියාත්මක කිරීම සම්බන්ධව අවධානය යොමු කරන ලෙසට අද දින වන 2026.10.01 වන දින නැවත සිහිපත් කර සිටින බව දන්වා සිටින්නෙමු.

මෙම දැන්වීම කරනුයේ 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත ප්‍රකාරව බව වැඩිදුරටත් දන්වමු.

විනිසුරු එල්.ටී.බී. දෙහිදෙණිය

සභාපති

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව